## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### අධ්‍යාපන පීඨය

### අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - ප්‍රථම සෙමෙස්තරය - 2019

### BED 2101 - අධ්‍යාපනයේ දාර්ශනික හා සමාජ විද්‍යාත්මක පදනම

**පැය තුනයි**

**අ කොටසින් පළමු ප්‍රශ්නය අතුළුව තවත් ප්‍රශ්න දෙකක් (02) ද, 'ආ' කොටසින් 6 වන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකක් ද බැගින් මුළු ප්‍රශ්න හයකට (6) පිළිතුරු සැපයිය යුතුය.**

---

උපදෙස්

- එක් එක් කොටසට අදාළ පිළිතුරු වෙන වෙනම පොත්වල ලියා වෙන වෙනම අමුණා බාර දෙන්න.
- ඒ ඒ පිළිතුරු පොත්වල මුල් පිටුවේ දකුණු කෙළවරේ කුමන කොටසද යන්න විෂය නම සමඟ සඳහන් කරන්න.
- 1 සහ 6 වන ප්‍රශ්නවලට ලකුණු 20 බැගින් ද අනෙකුත් ප්‍රශ්නවලටත් ලකුණු 15 බැගින් ද වෙන් කර ඇත.

### අ කොටස - අධ්‍යාපනයේ දාර්ශනික පදනම

1. i. අධ්‍යාපන අරමුණු සහ අධ්‍යාපන ඉලක්ක අතර ඇති වෙනස උදාහරණ සමගින් පැහැදිලි කරන්න.

   ii. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයේ මූලික නිපුනතා හතරක් (4) ලියන්න.

   iii. අධ්‍යාපන දර්ශනයේ කාර්යයන් හතරක් (4) ලියන්න.

   iv. අධ්‍යාපනය සහ දර්ශනය අතර ඇති සබඳතාව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

   v. මහාචාර්ය කෙවින් රයන් ගේ (Kevin Tyne) SIX – 'E' ආකෘතිය නම් කරන්න.

(ලකුණු 4 බැගින් x 5 = ලකුණු 20)

2. i. අධ්‍යාපන සංකල්පයේ ස්වභාවය උදාහරණ තුලින් පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. අධ්‍යාපනය සැබෑ අර්ථයෙන් ක්‍රියාවට නැංවීමට ඇති බාධක කවරේදැයි ශ්‍රී ලංකාව ඇසුරින් උදාහරණ ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 8)

3. i. ස්වභාවධර්මවාදී න්‍යායයේ හෝ විඥානවාදී න්‍යායයේ දාර්ශනික මූලධර්ම පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. ඉහත දාර්ශනික මූලධර්ම ඔවුන්ගේ අධ්‍යාපනික අදහස් තුළ නියෝජනය වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 8)

4. i. මහත්මා ගාන්ධිතුමාගේ දාර්ශනික පැතිකඩ පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. විසි එක් වන සියවස සඳහා එම දාර්ශකික පැතිකඩ අදාළ කර ගත හැකි ආකාරය කෙසේදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 8)

5. i. චරිතායන අධ්‍යාපනයෙහි අවශ්‍යතාව පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. චරිතායන අධ්‍යාපනය හා සම්බන්ධ මූලධර්ම හයක් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

## ආ කොටස - අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම

6. i. සංස්කෘතිය හා උපසංස්කෘතිය අතර වෙනස පැහැදිලි කරන්න.

   ii. අවධිමත් සමූහ පාසලේ අන්තර් ක්‍රියාවලියට හිතකරව බලපාන ආකාරය හඳුන්වන්න.

   iii. සම අධ්‍යාපන අවස්ථා සංකල්පයේ උප සංකල්ප හතර නම් කරන්න.

   iv. අධ්‍යාපනය, සමාජ වෙනස්වීමට ප්‍රමුඛ කරගත් අවස්ථා රටවල් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

   v. සමාජානුයෝගී කාරකයක් ලෙස රූපවාහිනිය යොදාගැනීමේ වාසි හා අවාසි දෙක බැගින් දක්වන්න.

(ලකුණු 4 බැගින් x5 = ලකුණු 20)

7. i. සංස්කෘතිය සමග අධ්‍යාපන ක්‍රියාවලිය සම්බන්ධ වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 7)

   ii. පාසලින් සංස්කෘතිය පවරාදෙන විවිධාකාර අවස්ථා හඳුන්වා එහිදී ගුරුවරයාගේ ක්‍රියා කලාපය කෙබඳු විය යුතු දැයි පෙන්වා දෙන්න.

(ලකුණු 8)

8. i. සමාජ ස්තරායනය අධ්‍යාපන අවස්ථා තීරණය වීමට බලපාන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 7)

   ii. පාසලක ඇති විධිමත් සමූහ ස්වරූපය හා අවිධිමත් සමූහ ස්වරූපය උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න.

(ලකුණු 8)

9. i. පාසල් සිසුන්ගේ අධ්‍යාපනයට සමාජානුයෝජනය දායකවන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. ශිෂ්‍යයෙකුගේ සමාජානුයෝජනයට ගුරුවරයා දායක විය හැකි ආකාරය සමපදස්ථ සමාජානුයෝජනය ඇසුරින් විග්‍රහ කරන්න.

(ලකුණු 8)

10. i. ගුරු භූමිකාව සතු සංකීර්ණත්වය පන්ති කාමර පාසල් හා සමාජයීය භූමිකා ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. වෘත්තියක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරන්න.

(ලකුණු 8)

○∘○∘○∘○∘○∘○∘○∘○∘